Library
19775

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

23 . 11 . 2016

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

Learning Resource Center
De Mazenod College
Kandana

සැලකිය යුතුයි:

- ප්‍රශ්නවලට සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයෙහිම ලියන්න. විභාග අංකය ..............

- දී ඇති ඡායාරූප ඇසුරින් අංක 01 සිට 05 දක්වා හිස්තැන් පුරවන්න.



මෙම රූපයෙන් දැක්වෙන කලාත්මක මුරගල දක්නට ලැබෙනුයේ (01) .............................. හිය. එය (02) .............................. යුගයට අයත් විශිෂ්ටතම මුරගල ලෙස සැලකේ. මෙයින් නිරූපණය කරන ප්‍රතාපවත් මානව රූපය (03) .............................. ලෙස හැඳින්වේ. මෙය කලුගලෙහි (04) .............................. ශිල්පක්‍රමය අනුව නෙළා ඇත. මුරගල (05) .............................. සංකේතවත් කිරීම සඳහා ඉදිකර ඇති බව කලා විචාරකයින්ගේ මතය වේ.

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශවලට වඩාත් ගැලපෙන රූපය **A, B, C, D, E** අතරින් තෝරා ඊට අයත් අක්ෂරය තිත් ඉරමත ලියන්න.


**A**


**B**


**C**


**D**


**E**

(06) ක්ෂණික රේඛා අධ්‍යයනයකි ..............................

(07) හින්දු දේවාල ආශ්‍රිතව හමුවන කලාත්මක දේව ප්‍රතිමාවකි ..............................

(08) සම්ප්‍රදායික සත්ව මෝස්තර අතර දක්නට ඇති අර්ධමිථ්‍යා ගණයට අයත් සැරසිල්ලකි
..............................

(09) වියුක්ත හැඩතල යොදා නිර්මාණය කරන ලද සැරසිලි ඒකකයකි .........................................

(10) ග්‍රැෆික් නිර්මාණයක් සඳහා උචිත සැලස්මකි ..............................................

- අංක 11 සිට 15 දක්වා අසා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයන්න.

(11) අසිත පත්ති කාමරයේ දී එක්තරා මාධ්‍යයකින් නිර්මාණය කළ මූර්තිය, සවිවීමෙන් පසු සීරීමෙන් කැපීමෙන් හා වත්කිරීමෙන් එහි විවිධ මතුපිට ස්වභාවයන් දක්වීය. එම මූර්තිය ඇඹීමට යොදාගත් මාධ්‍ය කුමක් ද? ..............................................

(12) වර්ණ යෙදීමේ දී ළඟ ඇති වස්තු තද වර්ණයෙන්ද, ඈත වස්තූන් ළා වර්ණයෙන් ද වර්ණ යෙදීමේ සිද්ධාන්තය හඳුන්වන නම කුමක් ද? ..............................................

(13) දේශීය ශාන්ති කර්ම ආශ්‍රිතව දක්නට ලැබෙන ගොක් කලාවේ දී රංග භාණ්ඩයක් ලෙස සකස්කරන ගොක් කොළ නිර්මාණයක් නම් කරන්න. ..............................................

(14) විවිධ වස්තූන් ඇඳීමේ දී දිග, පළල, උස යන අංග තුනම භාවිතකර ඉස්මතු කර දක්වියහැකි මූලිකාංගය නම් කරන්න. ..............................................

(15) කැලණිය, නවගමුව, මොළගොඩ යන ප්‍රදේශවල ප්‍රචලිතව පවත්නා සම්ප්‍රදායික ජන කලා කර්මාන්තය කුමක් ද? ..............................................

- අංක 16 සිට 20 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(16) මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය අනුව, අනුරාධපුර යුගයේ සඳකඩ පහණින් සංකේතවත් වනුයේ,
(1) සතර දිශාවයි (2) සංසාර චක්‍රයයි
(3) ඉර හා හඳයි (4) සශ්‍රීකත්වය යි

(17) තලන වැඩ හා වාත්තු වැඩ යන ශිල්පක්‍රම භාවිතකරන පාරම්පරික ජන කලා කර්මාන්තයට අයත් වන භාණ්ඩයකි.
(1) සේරක්කාල (2) උෟරාකැට (3) වඩිම්බුඋළු (4) පෙති උළු

(18) චෛතිය සර, ථූපසර ලෙස හඳින්වෙන ගෘහ නිර්මාණ අංගය
(1) කුඩා චෛත්‍ය වටා සතර දෙසින් ඉදිකළ තොරණ් විශේෂයකි
(2) විශාල චෛත්‍ය වටා සතර දෙසින් ඉදිකළ තොරණ් විශේෂයකි
(3) කුඩා චෛත්‍ය මැදිකර එහි ආරක්ෂාව පිණිස ඉදිකළ ගෘහයකි
(4) විශාල චෛත්‍ය මැදිකර එහි ආරක්ෂාව පිණිස ඉදිකළ ගෘහයකි

(19) මෙම සටහනින් දැක්වෙන සම්ප්‍රදායික සැරසිලි මෝස්තරය අයත් වනුයේ,
(1) දිව්‍ය ගණයටය
(2) උද්භිද ගණයටය
(3) අර්ධ නිරූප ගණයටය
(4) නිර්ජීවී ගණයටය



(20) භාණ්ඩ හා සේවා ප්‍රචාරණය සඳහා වෙළඳ දැන්වීම් නිර්මාණය කිරීමේ දී මූලික අවධානය යොමුවිය යුත්තේ,

(1) සරල හැඩතල හා අවම වර්ණ භාවිත කරමින් නිර්මාණය කිරීමයි
(2) නිර්මාණාත්මක අක්ෂර බහුලව භාවිත කිරීමයි
(3) පාරිභෝගිකයා පොළඹවන සුළු හා ආකර්ශණය වන අයුරින් නිර්මාණය කිරීම
(4) ඉතා සංකීර්ණ රේඛා හැඩ හා වර්ණ මාලාවක් යොදා ගැනීමයි

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පහත 'අ', 'ආ' හා 'ඉ' කොටස් වලින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.

- 'අ' කොටස - චිත්‍ර සංරචනය

(1) සිරිපාද වන්දනාව සඳහා යන වන්දනා නඩයක්
(2) දුම්රිය එනතුරු බලා සිටින්නෝ
(3) මල් ප්‍රදර්ශනයක් නරඹන පිරිසක්
(4) තොටුපොළක/ වැවක දිය නාමින් විනෝදවන ළමයි

- 'ආ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

(5) පාසලේ වාර්ෂික චිත්‍ර ප්‍රදර්ශනය සඳහා සැකසූ සමරු කලාපයට උචිත පිට කරවරයක්
(6) ළමා ගීත ඇතුළත් පොතක් සඳහා උචිත පිට කවරයක්
(7) නව පළතුරු යෝගට් පානයක් සඳහා සුදුසු වෙළඳ දැන්වීමක් (සුදුසු නමක් යොදන්න.)

- 'ඉ' කොටස - මෝස්තර

(8) කාන්තා කුඩයක් සම්ප්‍රදායික මෝස්තර ඇසුරින් සැරසිලි කරන්න.
(9) සංගත වර්ණ භාවිතකර කුෂන් කවරයක මුළුතල මෝස්තරයක්
(10) මල්, ගෙඩි, කොළ නිර්මාණාත්මකව භාවිත කර ගවුම් රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්

(ලකුණු 60)

Learning Resource Center
De Mazenod College
Kandana